# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,212—1960 ඔක්තෝබර් 14 වැනි සිකුරාදා—14.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 227 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 230 | අය-වැය ලේඛන ... ... | 233 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 234 |


## පළාත් පාලන නිවේදන

### බණ්ඩාරවෙල පළාත් ආණ්ඩු සභාවේ පාලන බල සීමා විශාල කිරීමයි

මැටිපිඹිය, කහත්තවෙල, උඩකුඹලවෙල යන ගම් හා කිනිගම නමැති ගමේ කොටසක් ද ඇතුළත් කිරීමෙන් බණ්ඩාරවෙල පළාත් ආණ්ඩු සභාවේ පාලන බලසීමා විශාල කොට, එහි දැනට ඇති ඡන්ද දායක කොට්ඨාශ සංඛ්‍යාව තවත් ඡන්දදායක කොට්ඨාශ දෙකකින් වැඩිකිරීම පිළිබඳ යෝජනාවක් දැනට සැලකිල්ලට භාජනව තිබේ.

මෙම යෝජිත සීමා විශාල කිරීම සම්බන්ධයෙන් ඉක්මණින් අවසාන තීරණයකට එළඹීමට හැකිවනු පිණිස ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සමිති සමාගම්වල හා පුද්ගලයන්ගේ ද අදහස් උදහස් විමසා සිටින ලෙස පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් මට නියමකොට තිබේ.

එබැවින් මේ පිළිබඳව ප්‍රකාශ කළ යුතු කරුණු තිබේ නම්, එම කරුණු 1960වේ ඔක්තෝබර මස 31 වැනිදාට ප්‍රථම මෙහි පහත සඳහන් ලිපිනය වෙත ලියා දන්වන ලෙස මෙයින් දන්වා සිටිමි.

ලිපිනය—පළාත් පාලන කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ.

මේ යෝජනාව පිළිබඳ සියලුම විස්තර තොරතුරු ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

වී. සී. ජයසූරිය,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

1960වේ ඔක්තෝබර මස 11 වැනි දින,
කොළඹ දීය.

10-408

---

### මාවත සහ කඳුඅහපත්තුවල ගම්කාර්‍ය සභාව

#### ගම්සභා ආඥාපනත—198 වැනි පරිච්ඡේදය

කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවත සහ කඳුඅහ පත්තුවල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යසභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

"9. ගම්සභා කොම්ටිය සතු පාරවල් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකිරීම.—1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සහා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3වෙනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මාවත හා කඳුඅහ පත්තුවල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යසභාව විසින් වර්ෂ 1953ක්වූ අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ (1) වැනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග පළල අනුව සාදා හෝ නැවත සාදා පවත්වා ගෙන යනු ලබන බව මෙයින් යෝජනාකරනු ලැබේ :—

| පාරේ අංකය | පාරේ නම | දිග සැතපුම් | දම්. | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | වල්දෙනිය බෙරගල පාර ... ... | 1 | 20 | ... 12 |
| 2. | පරගම්මන–ඇකිරියගල–රද්දල පාර ... | 3 | — | ... 14 |
| 3. | ඇවුනුගල්ල–මීනුවාංගමුව පාර ... | 1 | — | ... 12 |
| 4. | හෙට්ටිමුල්ල–මීදෙණිය පාර ... | 1 | 20 | ... 14 |
| 5. | මීදෙණිය–මොරොන්තොට පාර ... | 3 | — | ... 14 |

සී. ඇල්. බී. රත්නායක,
ගම්කාර්‍ය සභාවේ සභාපති තැන.

1960.10.5 වැනි දින,
ගම්කාර්‍යසභා කාර්‍යාලය,
මොරොන්තොට.

| පාරේ අංකය | පාරේ නම | දිග සැතැපුම් | දම. | පළල අඩි |
|---|---|---|---|---|
| 162. | කොටකුඹුර–බොස්සැල්ල පාසල පාර ... | — | 40 | ... 8 |
| 163. | පාරඹේ–දම්පැල්ගොඩ පාර ... | — | 60 | ... 8 |
| 164. | ඇරැගම–දෙගලතිරිය පාර ... | — | 40 | ... 8 |
| 165. | ඇරැගම–පාරඹේ පාර ... ... | — | 60 | ... 7 |
| 166. | ඇරැගම–බොස්සැල්ල පාර ... | — | 60 | ... 8 |
| 167. | රොටුව–මාබෝපිටිය පාර ... | 1 | 40 | ... 8 |
| 168. | ඇකිරියගල–ඇවුනුගල්ල පාර ... | 1 | — | ... 8 |
| 169. | ඇකිරියගල–කදුරුගහරුප්ප පාර ... | 1 | 40 | ... 9 |
| 170. | ඇකිරියගල–බටේකරඩුපොන පාර ... | 1 | — | ... 8 |
| 171. | ඇකිරියගල–කවුඩුගම පාර ... | — | 40 | ... 7 |
| 172. | ඇකිරියගල–විල්ගම–කොස්සින්න පාර ... | — | 40 | ... 12 |
| 173. | ඇකිරියගල–කොස්සින්න පාර ... | — | 40 | ... 12 |
| 174. | වල්පොල–කරඩුපොන පාර ... | — | 30 | ... 12 |
| 175. | වල්පොල–කරඩුපොන–දීවෙල පාර ... | 1 | 40 | ... 6 |
| 176. | පල්ලේගම–රද්දල පාර ... ... | — | 40 | ... 14 |
| 177. | කවුඩුගම–දික්කොහුපිටිය–ඇකිරියගල පාර | — | 60 | ... 9 |
| 178. | කොස්සින්න–ඇකිරියගල පාර ... | — | 60 | ... 10 |
| 179. | නිම්මල්ගොඩ–පල්ලේගම පාර ... | — | 60 | ... 6 |
| 180. | වල්පොල–බොලමුනුව පාර ... | — | 20 | ... 6 |
| 181. | ඇවුනුගල්ල–ඇකිරියගල පාර ... | — | 60 | ... 8 |
| 182. | බුළුරුප්ප–දික්කොහුපිටිය පාර ... | — | 40 | ... 14 |
| 183. | විල්ගම–ඇකිරියගල පාර... ... | — | 40 | ... 12 |
| 184. | ඇකිරියගල–පිටිහුම පාර ... | 1 | — | ... 6 |
| 185. | පිටිහුම–නිම්මල්ගොඩ පාර ... | — | 60 | ... 6 |
| 186. | පිටිහුම–මාරපන පාර ... ... | — | 20 | ... 6 |
| 187. | පිටිහුම—ඇටෝරුවාව පාර ... | — | 20 | ... 6 |
| 188. | පිටිහුම–බොහොර පාර ... ... | 1 | — | ... 6 |
| 189. | ගොඩිගමුව–මලවිට පාර ... ... | 1 | 40 | ... 6 |
| 190. | ගොඩිගමුව–හපුවිට–උඩගම පාර ... | 1 | — | ... 9 |
| 191. | හපුවිට–උඩගම–වතුර පාර ... | — | 60 | ... 8 |
| 192. | වතුර–නිමැල්ල–කෙහෙල්වත්ත පාර ... | 1 | 40 | ... 6 |
| 193. | වතුර–උඩුමාගම පාර ... ... | — | 60 | ... 8 |
| 194. | වතුර–අළුත්ගමකන්ද පාර ... | — | 20 | ... 8 |
| 195. | බණ්ඩාරවත්ත–රුප්පවත්ත පාර ... | — | 10 | ... 6 |
| 196. | වතුර–පුහුල්වලකන්ද පාර ... | — | 60 | ... 8 |
| 197. | රොටුව–කෙහෙල්වත්ත පාර ... | — | 10 | ... 6 |
| 198. | මලවිට–වල්කතුරුදෙනිය–මොරොන්තොට පාර ... ... ... | — | 40 | ... 6 |
| 199. | කුරුම්නියාගොඩ–බතලවත්ත පාර ... | — | 6 | ... 6 |
| 200. | මොරොන්තොට–කෙහෙල්වත්ත පාර ... | 1 | 40 | ... 14 |
| 201. | තලිලියැද්ද–පල්ලේගම පාර ... | 1 | — | ... 6 |
| 202. | ගොඩිගමුව–මුත්තෙට්ටුවත්ත–මලවිට පාර | 1 | — | ... 6 |
| 203. | හපුවිට උඩගම මොරොන්තොට පාර ... | 1 | — | ... 14" |

10–240

---

## මෙගොඩපොත ගම්කායර්‍ය සභා ප්‍රදේශය

### ගම්සභා ආඥාපනත—198 වෙනි පරිච්ඡේදය

මෙගොඩපොත ගම්කායර්‍ය සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. සී. රාජපක්‍ෂ,
සභාපති,
මෙගොඩපොත ගම්කායර්‍ය සභාව.

ගම්කායර්‍ය සභා කායර්‍යාලය,
ඌරාපොල, 22–9–60.

"9. ගම්කායර්‍ය සභාවට අයිති පාරවල්.—1952 අංක 6 දරණ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3වෙනි වගන්තියේ පළමුවන උප වගන්තිය යටතේ මෙගොඩපොත ගම්කායර්‍ය සභාව විසින් වර්ෂ 1954 ක්වූ ජුලි මස 2 වෙනි දින නො. 10,689 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙහි පහත සඳහන් කර ඇති පාරවල් සහ අඩි පාරවල් ඉදිරියෙන් සඳහන් කර ඇති නියම දිග පළල අනුව එකී පාරවල් සෑදීම හා ප්‍රතිසංස්කරණය කිරීමට මෙම ගම්කායර්‍ය සභාවේ එච්. ඩබ්ලිව්. ඇල්බට් සහ ආර්. වීරසිංහ යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරගන්නා ලදී :—

| අංකය | කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ නම | දිග හැතැප්ම |
|---|---|---|---|
| 1. ... | 1. ගොඩගම | ... ගොඩගම–පැල්පිට පාර ... ... ... | 3 |
| 2. ... | එම | ... ගොඩගම–ගොවිජනපද පාර ... ... ... | ½ |
| 3. ... | 2. පැල්පිට–විරාගොඩ | ... පැල්පිට–හාල්පන්දෙනිය පාර ... ... ... | 1½ |
| 4. ... | එම | ... පැල්පිට–වැලිකඩමුල්ල පාර ... ... ... | ¾ |
| 5. ... | 3. වැලිකඩමුල්ල | ... වැලිකඩමුල්ල–පාසැල් පාර ... ... ... | ¾ |
| 6. ... | එම | ... වැලිකඩමුල්ල–හොරකැලේ පාර ... ... ... | ½ |
| 7. ... | 4. පල්කුඹුර | ... දීණාපමුණුව–පල්කුඹුර පාර ... ... ... | 1 |
| 8. ... | එම | ... වඳුරාමුල්ල–පල්කුඹුර පාර ... ... ... | ½ |
| 9. ... | 5. අලවල | ... අලවල–මහකන්ද පාර ... ... ... | 1 |
| 10. ... | එම | ... අලවල–කන්ද කුඹුර පාර ... ... ... | 1¾ |
| 11. ... | එම | ... අලවල–මීනිපිටි පාර ... ... ... | 1 |
| 12. ... | එම | ... අලවල–උඩවක පාර ... ... ... | 2 |
| 13. ... | එම | ... අලව්ල–තුන්නෝකිඳ පාර ... ... ... | 1¾ |
| 14. ... | 6. අතාළුදකන්ද | ... අතාළුදකන්ද–උඩුවක පාර ... ... ... | 2½ |
| 15. ... | 7. කරස්නාගල–නිකහැටිකන්ද | ... කරස්නාගල–නිකහැටිකන්ද පාර ... ... ... | 2½ |
| 16. ... | හපුගස්තැන්න | ... කරස්නාගල-හපුගස්තැන්න පාර ... ... ... | 1½ |
| 17. ... | එම | ... කරස්නාගල–අල්ගම පාර ... ... ... | 1½ |
| 18. ... | එම | ... කරස්නාගල–කන්දෙගම පාර ... ... ... | 1¼ |
| 19. ... | 8. දීණාපමුණුව | ... දීණාපමුණුව–මීනිපිටි පාර ... ... ... | ¼ |
| 20. ... | එම | ... දීණාපමුණුව–ගංගොඩේ පාර ... ... ... | 1 |
| 21. ... | 9. යටවක–ඌරාපොල–වඳුරාමුල්ල–ඌරාපොල | ... පල්කුඹුර–කරස්නාගල පාර ... ... ... | 4 |
| 22. ... | එම | ... යටවක–මීනිපිටි පාර ... ... ... | ½ |
| 23. ... | එම | ... යටවක–දීණාපමුණුව පාර ... ... ... | 2 |
| 24. ... | එම | ... යටවක–ගොවිජනපද පාර ... ... ... | 1½ |
| 25. ... | එම | ... යටවක–පන්සල පාර ... ... ... | 1 |
| 26. ... | 10. නාගොඩ | ... නාගොඩ–කොරම්ල්ල පාර ... ... ... | 1 |
| 27. ... | එම | ... නාගොඩ–ගංගොඩේ පාර ... ... | ½ |
| 28. ... | එම | ... නාගොඩ–කහටඹිවිට පාර ... ... ... | 3 |
| 29. ... | 11. බෝපැත්ත | ... බෝපැත්ත–අරුප්පස්ස පාර ... ... ... | 1½ |
| 30. ... | එම | ... බෝපැත්ත–මීනිපිටි පාර ... ... ... | ½ |
| 31. ... | එම | ... බෝපැත්ත–පින්වත්ත පාර ... ... ... | ½ |
| 32. ... | එම | ... බෝපැත්ත හරහා මඩකොටුව පාර ... ... ... | 1½ |

| අංකය | | කොට්ඨාශයේ නම සහ අංකය | පාරේ නම | දිග හැතැප්ම |
|---|---|---|---|---|
| 33. | 12. | අරුප්පස්ස–කුරවලාන | අරුප්පස්ස–කුරවලාන පාර | 1 |
| 34. | | එම | අරුප්පස්ස–කුරවලාන මිනීපිටි පාර | 1 |
| 35. | | එම | කුරවලාන ගංගොඩේ පාර | 1 |
| 36. | | එම | කුරවලාන–ඕපත්ඇල්ල පාර | 2 |
| 37. | 13. | කහටඕවිට | කහටඕවිට–අගුරාවිල හරහා ඕගොඩපොල පාර | 1½ |
| 38. | | එම | කහටඕවිට–කුරවලාන–යල්කොටුදෙනිය හරහා පාර | ½ |
| 39. | | එම | කහටඕවිට–ගොඩැල්ල වත්ත ඕවිට හරහා උඩුගොඩ පාර | ½ |
| 40. | 14. | පරණගම | පරණගම අලිවලපල්ල සොහොන්පිටි පාර | 1 |
| 41. | | එම | පරණගම තේවත්ත පාර | ½ |
| 42. | | එම | පරණගම–ඕගොඩපොල පාර | ½ |
| 43. | 15. | බෙරළුන්න–ගල්බොඩ | බෙරළුන්න–පරණගම–රුක්මලේ පාර | 1 |
| 44. | | එම | බෙරළුන්න–සොහොන්පිටි පාර | ½ |
| 45. | | එම | ගල්බොඩ–ඕපත්ඇල්ල පාර | 1 |
| 46. | 16. | ඕපත්ඇල්ල | ඕපත්ඇල්ල–ලාවුළුපිටිය පාර | 1 |
| 47. | 17. | ලාවුළුපිටිය–කුරුවමුල්ල | ලාවුළුපිටිය–කුරුවමුල්ල හරහා හප්පිටිය පාර | 2½ |
| 48. | | එම | කුරුවමුල්ල–පාසැල් පාර | ½ |
| 49. | 18. | හප්පිටිය | හප්පිටිය පාර | 1½ |
| 50. | 19. | වල්ගම්මුල්ල | වල්ගම්මුල්ල–වායගොල්ල දෙවට පාර | 1 |
| 51. | | එම | වල්ගම්මුල්ල–හප්පිටිය පාර | 1½ |
| 52. | 20. | මඩකොටුව | මඩකොටුව–තිඹිරිගම පාර | 2 |
| 53. | | එම | මඩකොටුව–වල්ගම්මුල්ල පාර | 2½ |
| 54. | 21. | රතඹලේ | රතඹලේ–කුඩුම්බිකන්ද පාර | 2½ |
| 55. | 22. | මීගල්ල | මීගල්ල කන්දෙ පාර | 1 |
| 56. | | එම | දීණාපමුණුව–මීගල්ල හරහා මඩකොටුව පාර | 1½ |
| 57. | 23. | මීවිටිගම්මන | මීවිටිගම්මන–හීන්න පාර | 1½ |
| 58. | 24. | බෝපාගම | බෝපාගම–නඩුවත්ත පාර | 2 |
| 59. | | එම | බෝපාගම–කුඩුම්බිකන්ද පාර | 1½ |
| 60. | | එම | බෝපාගම–හිනහැටිකන්ද පාර | 1¾ |
| 61. | | එම | බෝපාගම–සොහොන්පිටි පාර | ¼ |
| 62. | | එම | බෝපාගම–රතඹලේ පාර | ¾ |
| 63. | | එම | බෝපාගම-හොරගොල්ල වත්ත පාර | 1 |
| 64. | | එම | බෝපාගම-යටවක පාර | ½ |

අඩි පාරවල්

| | | |
|---|---|---|
| 1. | ගෝඩගම–දඹුටුව අඩි පාර | ½ |
| 2. | කරස්නාගල–තුන්නෝකිඳ අඩි පාර | 1½ |
| 3. | කරස්නාගල-නිකහැටිකන්ද මිනීපිටි පාර | 1½ |
| 4. | නිකහැටිකන්ද පාසැල් පාර | ½ |
| 5. | ගොඩගම-උතුවෙල පාලම–වැලිපිල්ලැව හරහා පාර | 1 |
| 6. | ගොඩගම–පෙතියාකන්ද–හග්ගල අඩි පාර | 1½ |
| 7. | බෝපැත්ත–අරුප්පස්ස අඩි පාර | ½ |
| 8. | පරණගම–කහටඕවිට අඩි පාර | 1 |
| 9. | දීණාපමුණුව අඩි පාර | ½ |
| 10. | බෝපාගම–පුරන්පොත්ත අඩි පාර | 2'' |

10–270

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත් වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධන වලට ද ඒ ආඥපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අතිත් තනතුරු ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්‍ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙනා සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයකට හෝ දෙවර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැතිනම්, අවුරුදු 2ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ට" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසාන යේ දී තනතුරුවල ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම උඩ රඳා පවතී.

ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන්ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදාතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් මෙහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලසා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙළ කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙළ කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස:
අවුරුදු———, මාස———, දින———.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### වින්නඹු සේවිකා තනතුර

නුවරඑළිය උඩපළාත ගම් කාර්ය සභාවේ සභාපති ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රු. 696 න් පටන් ගෙන වර්ෂයකට රු. 18 බැගින් 19 වරක් වැඩිවී රු. 1,038 තෙක් නගී. එහි රු. 822 හා රු. 948 වාර්ෂික වැටුප්වලට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩයිම් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස :—1960 ඔක්තෝබර් 28 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගේ දක්ෂතා පිළිබඳ සහතික දරණ ලියා පදිංචිවූ වින්නඹු සේවිකාවෝ විය යුතුයි. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහලෙන් හා දෙමළෙන් කතා කළ හැකි අය ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. පළාත් පාලන සේවා සාමාජිකාවන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් වහාම ඒ බව නුවරඑළිය උඩපළාත ගම්කාර්ය සභාවේ සභාපති වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයිනම් එය නැති වන්නේ ය.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1960 ඔක්තෝබර 28 දිනට හෝ ඊට පළමු, උඩපළාත ගම් කර්ය සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

එච්. ඩබ්ලිව්. ඇම්. අප්පුහාමි,
නුවරඑළිය උඩපළාත ගම්කාර්ය සභාවේ සභාපති.

1960 ඔක්තෝබර 6 වැනිදා,
හල්ග්‍රන්ඔය, රාගල.

8329

## පළාත් පාලන සේවය

### උඩපළාත ගඟ පහළ ගම්කාර්ය සභාවේ පියුන් තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—22×12—රුපියල් 804; රුපියල් 636 සහ රුපියල් 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම්.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස :—1960 ඔක්තෝබර් 14 දිනට වයස අවුරුදු 20 ට නො අඩු, 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් හා ඉංග්‍රීසි 3 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1960 ඔක්තෝබර් 28 දිනට හෝ ඊට පළමු ගම්පොළ, ගල්ගෙඩියාවේ, ගඟ පහළ ගම්කාර්ය සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුය.

පී. බී. හේරත්,
උඩ පළාත ගඟ පහළ ගම් කාර්ය සභාවේ සභාපති:

1960 සැප්තැම්බර් 22 දින,
ගම්පොළ, ගල්ගෙඩියාව,
ගඟ පහළ ගම්කාර්ය සභා. කාර්යාලයේ දීය.
9579

---

## අය-වැය ලේඛන

### කොලොන්නාව නගර සභාව

#### 1960 වර්ෂයේ තුන්වෙනි අතිරේක වැය ලේඛනය

| වැය ශීර්ෂය | | මුදල රු. | ශ. | සභා අනුමතිය |
|---|---|---|---|---|
| බී.4 | එළිය සැපයීම ... ... ... ... | 354 | 83 | ... අංක 27, මහ සභාව, 21.6.60 |
| බී.4 | එම ... ... ... ... | 500 | 0 | ... අංක 38, එම |
| බී.4 | එම ... ... ... ... | 450 | 0 | ... අංක 20, එම 11.7.60 |
| ඊ.5(බී) | වතුර සැපයීම ගබඩා ... ... ... ... | 1,200 | 0 | ... අංක 22, එම |
| ඊ.6(බී) | ආරෝග්‍යශාලා නඩත්තු ... ... ... ... | 4,000 | 0 | ... අංක 19, එම |
| ඒ.2(කේ) | අතිකාල දීමනා ... ... ... ... | 500 | 0 | ... අංක 10, විශෙෂ රැස්වීම 27.7.60 |
| ඊ.6(බී) | ආරෝග්‍යශාලා නඩත්තුව ... ... ... ... | 250 | 0 | ... අංක 9, එම |
| ඩී.4 | ගොඩනැගිලි නඩත්තුව ... ... ... ... | 2,932 | 24 | ... අංක 10, මහ සභාව, 8.8.60 |
| බී.14 | ජීවනාධාර ... ... ... ... | 8,000 | 0 | ... අංක 23, එම 15.9.60 |
| ඩී.8 | ජීවනාධාර ... ... ... ... | 1,800 | 0 | ... එම |
| ඊ.1(ඊ) | විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... ... ... | 200 | 0 | ... එම |
| ඊ.2(සී) | ගබඩා ... ... ... ... | 800 | 0 | ... එම |
| ඊ.3(ඒ) | කසළශෝධක වැටුප් ... ... ... ... | 8,000 | 0 | ... එම |
| ඊ.3(සී) | ගබඩා ... ... ... ... | 1,000 | 0 | ... එම |
| ඊ.3(ඩී) | අසූචි ඩිපෝ කුලී ... ... ... ... | 300 | 0 | ... එම |
| ඊ.5(සී) | වතුර සැපයීම, නඩත්තු ... ... ... ... | 200 | 0 | ... එම |
| ඊ.6(ඊ) | ආරෝග්‍යශාලා ජීවන වියදම ... ... ... | 4,000 | 0 | ... එම |
| ජී.7 | සොහොන් පළවල් ජීවන වියදම ... ... ... | 600 | 0 | ... එම |
| එච්.5 | සුනඛ කරත්තයේ නඩත්තුව... ... ... ... | 50 | 0 | ... එම |
| ජේ.5(ඒ) | විදුලි දෙපාර්තමේන්තුව ණය, පොලිය ... ... ... | 0 | 36 | ... එම |
| ජේ.5(බී) | විදුලි දෙපාර්තමේන්තුව කොටස් මුදල ... ... ... | 0 | 90 | ... එම |
| | | 35,138 | 33 | |

වර්ෂ 1960ක්වූ ජුනි මස 21 වැනි දිනද, ජූලි මස 11 වැනි දිනද, ජූලි මස 27 වැනි දිනද, අගෝස්තු මස 8 වැනි දින හා සැප්තැම්බර් මස 15 වැනි දිනද කොළොන්නාව නගර සභාවේදී පවත්වන ලද මාසික රැස්වීම් වලදී හා විශෙෂ රැස්වීම්වලදී පිළිගෙන ස්ථිර කරන ලදි.

වී. ඇස්. ගුණදස සිල්වා,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

පළාත් ආණ්ඩුසභා කාර්යාලය,
කොළොන්නාව, වැල්ලම්පිටිය,
3.10.60.
10–168

---

### බලපිටිය සුළු නගර සභාව

#### 2 වැනි පරිපූරක වැය—1960

කාණ්ඩ 1

| වැය ශීර්ෂය | | ගණන රු. | ශ. | | යෝජනා සැඳහුම් |
|---|---|---|---|---|---|
| බී. 2 නඩත්තු | ... | 1,000 | 0 | ... | 1960 අගෝස්තු මස 30 වැනි දින යෝජනා අංක 6. |

1960ක්වූ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද විශේෂ රැස්වීමේ සකසා ස්ථිර කරනලදි.

ජී. එච්. සිල්වා,
සභාපති.

බලපිටිය නගරසභා කාර්යාලය,
1960.9.7.

සම්මත කරන ලදි.

ඇස්. සුන්දරමූර්ති,
වැඩබලන පළාත්පාලන කොමසාරිස් වෙනුවට.

කොළඹ, ඔක්තෝබර් 6, 1960.
10–211

# විවිධ දැන්වීම්

## මැද පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන් ස්ථාන යෙහි 1960 වර්ෂයට මස් විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්වා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම් ප්‍රදෙශයේ ගම්කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| එච්. ඇල්. ඇම්. ජුනයිදීන් | හරක් මස් සහ එළුමස් | කොස්ගහවත්ත, මාතින්ගල, වැලිපැන් නගහමුල්ල. |

ඇස්. මොහමඩ් සාලි,
මැද පළාත ගම්කාර්ය සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් මස 29 වෙනි දින දීය,
තබ්බෝව, නාත්තන්ඩිය.
10-159

---

## මැද පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන් ස්ථාන යෙහි 1961 වර්ෂයට මස් විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්වා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. තාහිර් | හරක් මස් සහ එළුමස් | මිල්ලගහවත්ත, කැකුලවාඩිය, නාත්තන්ඩිය. |

ඇස්. මොහමඩ් සාලි,
මැද පළාත ගම්කාර්ය සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් මස 29 වෙනි දින දීය,
තබ්බෝව, නාත්තන්ඩිය.
10-162

---

## ගල්බොඩ කෝරලේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (201 වන පරිච්ඡේදය)

කිරිගංදෙනියේ පදිංචි සම්සුදීන් ලෙබ්බෙ මොහමදු රෂීදු යන අය මාවනැල්ල නගරයේ කොළඹ-නුවර පාරේ අංක 127 දරණ ස්ථානයේ එළුවන් මරා විකිණීම සඳහා 1960 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කොට ඇති බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වන ගල්බොඩ කෝරලේ ගම් ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දහ හතර දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදයේ) අංක 7 දරණ 1947 අංක 44 දරන ආඥාපනතින් සංශෝධිතවූ ආඥා පනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඇම්. ආර්. බී. දාස්වත්ත,
සභාපති.

ගම් කාර්ය සභා කාර්යාලය,
මාවනැල්ල, ඔක්තෝබර් 3, 1960.
10-160.

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1961 වර්ෂයට බල පත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම් බල පත්‍ර නිකුත් කිරීමට විරුද්ධව නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඇස්. ඇම්. ෂෙරීෆ් සමාගම, රාගල කඩවීදිය, හල්ග්‍රන්ඔය. | සහ රාගල, හරක් මස් විකිණීම. |
| 2. ඇස්. ඇම්. ෂෙරීෆ් සමාගම, රාගල කඩවීදිය, හල්ග්‍රන්ඔය. | සහ රාගල, එළු මස් විකිණීම. |
| 3. ඇම්. අබ්දුල් රහීම් මහතා, සෙල්වකන්ද, උඩපුස්සැල්ලාව. | සෙල්වකන්ද, හරක් මස් විකිණීම. |

එච්. ඩබ්ලිව්. ඇම්. අප්පුහාමි.
උඩපලාත ගම්කාර්ය සභාවේ සභාපති.

1960 ඔක්තෝබර 6 වැනි දින,
හල්ග්‍රන්ඔය, රාගල පිහිටි
උඩපලාත ගම්කාර්ය සභා කාර්යාලයේ දීය.
10-248

## මාතලේ මැදසිය පත්තු ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1961 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන මාතලේ මැදසිය පත්තු ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම "ගැසැට් පත්‍රයේ" පලවන දින සිට 14 දිනක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපණතින් සංශොධිත වූ අංක 6 දරණ ආඥාපණත යටතේ දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඒ. අබ්දීන්, ඇල්කඩුව පාර, උකුවෙල | උකුවෙල උඩකුරුන්ත ගේනේ වත්ත, හරක් මස් කඩය. |
| 2. කේ. ඇස්. නූර්මොහොමඩ්, මානාබොඩ, උකුවෙල | මානාබොඩකාන්සයිබු වත්තේ හරක් මස් කඩය |
| 3. කේ. ඒ. හමීඩ්, වරකාමුර, උකුවෙල | වරකාමුරේ අංක 96, මුඩියන්සේලාගේ වත්ත, හරක් මස් කඩය |

ඇම්. බී. කුලතුංග,
මාතලේ මැදසියපත්තු ගම්කාර්ය සභාවේ ප්‍රධානතැන.

වර්ෂ 1960ක්වූ ඔක්තෝබර් මස 6 වැනි දින,
මාතලේ මැදසියපත්තු ගම්සභා කාර්යාලයේදීය,
උකුවෙල.

10-286

---

## කන්ද පල්ල කෝරලේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවළුන් එහි සඳහන් කර තිබෙණ ස්ථානවල 1961 කේ වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මාවෙත එවා තිබෙණ බව මස් පිණිස සතුන් මරන්නන් පිලිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 1947තේ අංක 44 දරන සංශෝධිත ආඥාපණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරනලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කන්ද පල්ල කෝරලේ ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද කියා ඒ බව සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළවූ දින සිට තිස් දිනක් ඇතුළත මාවෙත ඉදිරිපත් කල යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඊ. බදුර්දීන්, පුවක්පිටිය, ගලේවෙල, | පුවක්පිටියේ ඉඟිණිගහමුල වත්ත | හරක් මස් |
| 2. ඊ. බදුර්දීන්, පුවක්පිටිය, ගලේවෙල, | බුළණවැවේ, මුගුණමල්යායේ වත්ත | හරක් මස් |
| 3. ඇම්. අබ්දුල් මජීඩ්, රංවැඩියාව, රංවැඩියාව, ගලේවෙල, | කෝසන්පිටියේ වත්ත | හරක් මස් |

ඊ. ඇම්. බී. රත්නායක,
ප්‍රධාන තැන.

1960 ඔක්තෝබර් මස 5 වැනි දින,
ගලේවෙලදීය.

10-287

---

## උඩුබද්දාව ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1960 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන උඩුබද්දාව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිලිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඕ. ඒ. හමීඩ්, අංක 224, රවුන් පාර, කුලියාපිටිය | පරගහගොඩැල්ල හේන, උඩුබද්දුව, ඉහලගම | හරක් මස් සහ එළු මස් |
| 2. ඇම්. ඕ. ඒ. හමීඩ්, අංක 224, රවුන් පාර, කුලියාපිටිය | කට්පිමහනවත්ත, කට්පිමහන | හරක් මස් සහ එළු මස් |

කේ. ආරියවංශ ඇස්. පෙරේරා,
උඩුබද්දාව ගම්කාර්ය සභාවේ සභාපති තැන.

ගම්කාර්ය සභා කාර්යාලය,
උඩුබද්දාව, 1960 ඔක්තෝබර් 6.
10-292.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.